

# මධුරි
**නිරාශ ගුණසේකර**

**නිමිත්ත: වසර විස්සකට පසුව, ඊටත් වඩා තුරුණුව, රූපවාහිනී තිරයක මධුරි ඩික්සිත් රඟනු දුටුවෙමි. නමුදු මම?**

පා සළඹ හඬවා ලිහිණි සරින
දෙළුම් කැකුළක් තියා මුව මඬළ
මරතොණ්ඩි රටාවෙන් හැඩ ඇන්ද
රතැඟිලිය හැඩ වුණෝ සිහිනෙන්ද...

අල්ලපු රටේ උන්නාට
ළැම විල පිරුණු සෙනෙහසක
නෙත් ඇල වුණා සඳහට ම
ගලවන්නෙ ඉතින් මං කෝම...

පුළුල් තිරයට නොතරම්
බාල පටියක කිසියම්
දැනෙන විට නුඹේ ගිනියම්
කෝම මං මෙහේ උහුලම්...?

කාලයත් එක්ක මතකය
උඩු හුළඟේ ම ගමනෙය
සේරු බිඳිලා වරල් ලිහිලා
යළිදු දුටුවේ නුඹ මය...!

වසර විස්සක හීනය
එදාටත් වඩා රස්නෙය
අන් අතක් ගෙන නුඹ නටද්දී
ආයෙ නැටවුනෙ මා මය...

තත බිඳෙද්දී සිතාරේ
ගසල් ගී පද රිදුම් දේ
නුඹෙ වුවනත, සැලෙන ඉඟ සුඟ
මට ම මා ගැන කියා දේ...

හොරා අරගෙන ගියා වාගේ
නුඹේ හෝරා කටුව දිවියේ
මගේ පොඩි උන් පවා දිනයක
නුඹෙන් ඇවිලී යාවි රාසේ...!



# ගරුතර නා හිමියනි මේ ඔබට බෝ බැතියෙනි

ඩැංඩිනොං ධම්මදීප භාවනා මධ්‍යස්ථානයේ විහාරාධිපති දිගාසිරි පතම් ගරුතර සංඝානන්ද හිමි නමට!

**ප්‍රභා කුමාරි ලියනආරච්චි**
නොක්ස් - වික්ටෝරියා

| | |
|---|---|
| දවටා චීවරය විසුවා සඝ | ගුණෙනී |
| සනහා නිවාලන දනමන බොදු | බැතිනී |
| වඩවා දහම් අවබෝධය ගුණ | ගිහිනී |
| හිමි සඳු සංඝානන්ද සමරම් බැති | සිතිනී |
| | |
| පතුරා සැමට බෝ මෙත් ගුණ | කරුණාව |
| සෙවනකි සැමට පංසල හා ඔබ | ගාව |
| සිත සනහවයි අප වෙත මදහස | පෑව |
| අගයමි තුති පුදමි කළ සාසන | සේවාව |
| | |
| කවුරුත් මුවග රැඳුනේ ඔබනම් දුක්ගන්නා | රාළ |
| නිබඳව රැදුනි පිළිතුරු සැමහට තුන් | කාල |
| තබනා බෝධි පූජාවට සවස් | කළ |
| පවසති සාධු නාදය දෙව් විමන් | වල |
| | |
| පුදනා හැම මලක රුවගුණ හිමිලඟ | රැඳුනා |
| පුදනා සුවඳ කූරක සුවඳත් හිමිලඟ | තිබුනා |
| පුදනා පහන් ආලෝකය හිමිරුව ලඟ | තිබුනා |
| ගලනා බුදුන් ගුණ හිමියනි බොහෝසේ | තිබුනා |
| | |
| මෙලොවින් පරලොවින් වන වැඩ අවැඩ | දැනගෙන |
| දැනුමෙන් ලොව දිනන්ට විය විරි වඩා | ගෙන |
| අනියත බව මෙදියත තුළ ඇති බව | සිතාගෙන |
| ගුණදම් වඩති නිවනේ මඟ සොදින් | දැන |
| | |
| පිරිසද නැණින් හැම දේ ගඟ නෙත් | ඇරවා |
| මුදවා ගනිති අප සැම දුක් ගින්නෙන් | ගලවා |
| ලොබ දෙස් මෝහ හැරදා යන ලෙස | දන්වා |
| සැකහැර දෙසති හැම දහමක් නෙතු | දල්වා |
| | |
| හිමිසඳු ප්‍රධානව සැදු සදහම් පාසල | ඉරිදා |
| ගුණ නැණ සපිරි දරුවන් වඩවයි | සැමදා |
| දෙස බස වැඩුම රිසි සිංහල පාසල | හින්දා |
| ලක්මව සැනහුනා දැක සිරි දරුවන් | බන්දා |
| | |
| උත්තම බුදුන් මඟ යන හිමි සඳු | සංඝානන්ද |
| ෂැරියුත් මහා මුගලන් හිමි සඳු පිළිවෙලින් | සඳ |
| වඩනා බවුන් දම් දීපයේ වඩමවා | හිද |
| මුදුනත් දී බැතිනි නමදී අසිරි | මැද |
| | |
| නහවා බෝ සමිඳු ඉල්ලම් සරණය | වේවා |
| ගත සිත වෙලා ඇති තුන්දොස් දුරු | වේවා |
| ඇත්නම් අපල ග්‍රහබල දොස් දුරු | වේවා |
| වේවා දිගාසිරි රෝ දුක් නොම | වේවා |
| | |
| කුලුනින් ගුණින් නුවණින් පසඳා | හැමවර |
| මෙතින් සිතින් පසිදති ගැටළු | වියතර |
| සිතින් කයින් වන වැරදි දැන සොදින | ගොරතර |
| දහම් වඩති, මුදවති ලෝ සැම | නිතර |
| | |
| පියකරු සත බඹ විහරණ සිව් | පෙදෙනී |
| වෑහෙයි නිබඳ මුවගින් ඔබෙ හිමි | සඳුනී |
| නිර්මල මොක් පිණිස වේවා ගුණ | ගිහිනී |
| පතනෙමි දිගා සිරි සඝනද හිමි | නමිනී |
| | |
| හිමියනි උපන් දිනයට ආසිරි | පතමී |
| තවතව බොඳුන මඟ යාමට ශක්තිය | පතමී |
| කරනා මෙපින් බලයෙන් රෝ දුරුවන්නට | පතමී |
| අපෙත් ආයුගෙන දිවසනු දිගාසිරි | පතමී |



# නගරයේ යුවතිය
**අතුල විජේවික්‍රම**

ඇස් වසා මිල කරන
නේක රැව්ටිලි වලින්
උදේ දහවල පුරා බැටකමි
වසා නර කෙස් පොදිය
උලා සායම් විලඳ
රැඟුම් ජීවිතේ වෙස් වලාගමි

සාජ්ජෙට පෑහෙන්න
මෝස්තර හැඩවෙන්න
රිදී සළුපිලි වලට ණයවෙමි

දූලි දුම් මද්දනේ
තැම්බිලා දන පපුව
තදින් අල්ලා හීනියට කහිමි

ඝෝර නද දස අතම
රාග දස්සන බෝම
වෝක්මන් එකෙන් බණ දම් අසමි

බිනර පෝයට දිලෙන
ගමේ පුන්සඳ දැකලා
ලොව්තුරා සුවේ මොහොතක් විඳිමි

# සියුම් ඉරිසියාවක්
**රුවන් නෙලු**

වෙරළ රළ බිඳෙන මානයක
අඩ අඳුරු තැබෑරුම කෙළවරක
මධු විතක් තොළ ගගා ඇති රාම
රාවණා සිහි කර කර

සියුම් ඉරිසියාවක ගිනි සිළුව
අවුස්සා අවුළුවා දුම්වැටිය
දුම් වළලු විසි කරනවා රාම
ලකොයිබින්ද වළල්ලට
මට නොමැති සැහැල්ලුව ?ල

නුරාවෙන් පෙරාගත් සුරාවක
අවසාන බිඳුව පමණක් ඉතිරි
මධු බඳුන බිම ගසා
බිඳ දමනවා රාම
ලකොයිබින්ද බඳුනකට
මට නොමැති සුරා මත ?ල

බිඳුණු වීදුරු කැබලි එකතු කොට
වියරු වේදනාවෙන්
අතීතය වෙත හැරී
ඉකි ගසනවා රාම
"කොහිද දැන් මෙතැන තිබු
මධු බඳුන ?"

සියුම් ඉරිසියාවක ගිනි සිළුව
තවමත් පසෙක ඇවිළෙන
දැවිය හැකි සැම දේම
සොය සොයා ඒ වෙත ම
ඇද ගන්න
දැවෙනු හැකි සැම දේම
සොය සොයා ඒ වෙත ම
ඇදී යන

boondi.lk




# තාවකාලික සිහිනයකට එරෙහිව
**එරංගා පෙරේරා**

අඳුරින් පිරුණු හිත් නිම්නයට
පහන් එළියක්
බිඳකුදු නොදී,
දෑස දල්වා දුරැත බලනා
කරුණ කිම?

සොඳුරු සර
වියැකී,
දුරින් දුරටම ගිය පසු

මියැදුණු
සිහින සර නොව
ලාවට හෝ
සහන් එළියයි අවැසි

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com